කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **01** LLA/26/05/25/01
වර්ණය : ඇම්බර්

ප්‍රභල අකුණු පිළිබඳව අවවාදාත්මක නිවේදනය


කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2026 මැයි මස 25 දින රාත්‍රී 11.30 දක්වා වලංගු වන පරිදි
2026 මැයි මස 25 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදී.

උඹ පළාත, අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්ක සඳහා

සූදානම් වන්න!

උඹ පළාතේත් අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවල පස්වරු 1.00 න් පමණ පසුව ගිගුරුම් සහිත වැසි සමග ප්‍රභල අකුණු ඇතිවීමේ හැකියාවක් පවතී.

ගිගුරුම් සහිත වැසි සමඟ එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.



ආරක්ෂිත පියවර:

අකුණු සහ ගිගුරුම් පවතින අවස්ථාවල පහත ආරක්ෂිත පියවරයන් අනුගමනය කරන මෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මහජනතාවට අවවාද කෙරේ.

- එළිමහනේ හෝ ගස් යට නොසිටිය යුතු අතර ආරක්ෂිත ගොඩනැගිල්ලක් හෝ සංවෘත වාහනයක් තුළ රැඳී සිටින්න.
- කුඹුරු, තේ වතු, ක්‍රීඩා පිටි මෙන්ම ජලාශ වැනි විවෘත ස්ථාන වල රැඳී සිටීමෙන් වලකින්න.
- රැහැන් සහිත දුරකථන සහ විදුලියට සම්බන්ධ කරන ලද විදුලි උපකරණ භාවිතයෙන් වලකින්න.
- බයිසිකල්, ට්‍රැක්ටර් සහ බෝට්ටු වැනි විවෘත වාහන භාවිතයෙන් වලකින්න.
- තද සුළං හේතුවෙන් ගස් හා විදුලි රැහැන් බිම ඇද වැටීමට ඉඩ ඇති බැවින් ඒ පිළිබඳව සැලකිලිමත් වන්න.
- හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ නිලධාරීන් ගේ සහය පතන්න.

වර්ණය: -රතු අනතුරු ඇඟවීම (පියවර ගන්න)	වර්ණය: -ඇම්බර් අවවාදාත්මක (සූදානම් වන්න)	වර්ණය: -කොළ (බලපෑමක් නැත)

Spatial rainfall distribution: Isolated: <25%, A few: 26-50%, Many: 51-75%, Most: 76-100%
Rainfall amount (mm): Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.